*සැ. යු.* - 2025. 02. 28 වැනි දින පළ කරන ලද අංක 2426 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,427 - 2025 මාර්තු මස 07 වැනි සිකුරාදා - 2025.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


## සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12. 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මාර්තු මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 මාර්තු මස 14 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

1 - B 082661 — 5,403 (2025/03)
F 1 - මෙම ගැසට් පත්‍රය www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

**බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය**

බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය

**සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම), අලෙවි නිලධාරී හා කෘෂිකර්ම නිලධාරී පුරප්පාඩු**

- **සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම) - තනතුරු 01**

(අ) *අධ්‍යාපන සුදුසුකම්* : කෘෂිකර්මය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම. උපාධිය ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) *වයස* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට *වයස අවුරුදු 22ට* නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

(ඇ) *වැටුප් පරිමාණය* : MM 1-1 2016 : රු. 53,175 - 10x1,375 - 15x1,910 - රු. 95,575

- **අලෙවි නිලධාරි - තනතුරු 02**

(අ) *අධ්‍යාපන සුදුසුකම්* : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අලෙවිකරණය ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් තිබිය යුතුය. මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන් ඇතුළත් වසර එකකට නොඅඩු ඩිප්ලෝමාවක් තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

(ආ) *වයස* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

(ඇ) *වැටුප් පරිමාණය* : MA 3-2016 : රු. 32,200 - 10x445 - 11x660 - 10x730 - 5x750 - රු. 54,960

- **කෘෂිකර්ම නිලධාරි - තනතුරු 01**

(අ) *අධ්‍යාපන සුදුසුකම්* : කෘෂිකර්මය විෂය සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය විෂයයන් තුනකින් සමත්ව තිබීම හා කෘෂිකර්මය ක්ෂේත්‍රයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ආ) *වයස* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

(ඇ) *වැටුප් පරිමාණය* : MA 2 - 1 - 2016 : රු. 30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - රු. 50,940

**සෑම අයදුම්කරුවෙකුම (සුදුසුකම්) :**

ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය) යහපත් චරිතයෙන් යුක්ත විය යුතුය සහ ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන විට බස්නාහිර පළාත තුළ වසර තුනක් (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කළ යුතුය.

**සෑම අයදුම්කරුවෙකු සඳහාම පොදු කරුණු :**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් ඒ4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කොට තොරතුරු සම්පූර්ණ කරන ලද අයදුම්පත 2025.03.21 දිනට හෝ ඊට ප්‍රථම මෙහි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. අවශ්‍ය

අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් හා නියමිත දිනට ප්‍රථම ඉදිරිපත් නොකරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සහතිකපත්වල පිටපත් සහතික කොට ඉදිරිපත් කළ යුතුය.

සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම් සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත තීරණය කරනු ලැබේ. කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි උපලේඛන II ප්‍රකාරව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

**agrosawp@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට ඉල්ලීමක් සිදු කිරීම තුළින් ආදර්ශ අයදුම්පත ලබා ගැනීමට හැක. ආදර්ශ අයදුම්පත් ඉදිරිපත් කිරීම සතියේ දින 05 තුළ (කාර්යාල දින) පෙ. ව. 8.30ත් ප. ව. 4.15 අතර සිදු කරනු ලැබේ.**

*ලිපි එවිය යුතු ලිපිනය* : සභාපති, කාෂි සේවා අධිකාරිය (බ. ප.), අංක 375 එච්, මාකුඹුර, පන්නිපිටිය.

දුරකථන අංක : 011 2855640, 011 2855859
ෆැක්ස් : 011 2855969

03- 62

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **මාර්තු** | 2025.03.07 | සිකුරාදා | 2025.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.14 | සිකුරාදා | 2025.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.21 | සිකුරාදා | 2025.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.28 | සිකුරාදා | 2025.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2025.04.04 | සිකුරාදා | 2025.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.11 | සිකුරාදා | 2025.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.17 | බ්‍රහස්පතින්දා | 2025.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.25 | සිකුරාදා | 2025.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2025.05.02 | සිකුරාදා | 2025.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.05.09 | සිකුරාදා | 2025.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.16 | සිකුරාදා | 2025.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.23 | සිකුරාදා | 2025.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.30 | සිකුරාදා | 2025.05.16 | සිකුරාදා | දහවල් | 12.00෧ |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.